INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: එකම දිනක් තුල ශ්‍රී ලංකාවේ අතුරුදහන් කරන ලද 280 ක නම් ලැයිස්තුවක් නව ITJP වෙබ් අඩවිය විසින් ප්‍රකාශයට පත් කෙරේ.**

2018 මැයි 15 වැනිදා

ජොහැන්නස්බර්ග්: අතුරුදහන් වූවන් පිළිබඳ සත්‍යය හෙළිදරව් කරගැනීමේ අවශ්‍යතාවක් වේ නම් 2009 සිවිල් යුද්ධයේ අවසාන දිනයේ බලහත්කාරයෙන් අතුරුදහන් කරනු ලැබූ සිය ගණනකට අධික සිදුවීම් සම්බන්ධයෙන් ඒ සමයේ හමුදා නායකයන්ගෙන් ප්‍රශ්න කිරීමේ වගකීමෙන් ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය (OMP) බැඳී සිටී. මේ අතුරුදහන් වූවන් අතර අඩුම වශයෙන් දෙමළ ළමයින් 29ක් වෙයි. අවසන් වරට දකින විට 2009 මැයි 18 හෝ ඒ ආසන්න දිනකදී ඔවුන් සිටියේ තම පවුලේ ඥාතීන් සමග ශ්‍රී ලංකා යුද හමුදාව භාරයේය. ජාත්‍යන්තර නීතිය අනුව ගත්කල මේවා බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ නියමාකාර සිද්ධිය.

*"එකම වර පුද්ගලයන් සිය ගණනක් එකම ස්ථානයෙන් අතුරුදහන් වනු, රට තුලත්, ඉන් පිටතත් සාක්ෂිකරුවන් ගණනාවක් විසින් සියැසින් දකින ලද, ශ්‍රී ලංකාවේ බලහත්කාරයෙන් අතුරුදහන් කරවන ලද විශාලතම තනි කණ්ඩායම මෙයයි,"* යනුවෙන් ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ (ITJP) අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය.

*"බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ සාපරාධී වගකීම ගැන බරපතල ලෙස සලකන්නේ නම්, විමර්ශනයට ලක් කළ යුතු ප්‍රථම සිද්ධිය මෙය බව අපි OMP කාර්යාලයට ලියා දන්වා යවා ඇත්තෙමු. භාර වන්නන් සහ ඔවුන් භාරගත් යුද හමුදා නිලධාරීන් පුද්ගලිකව ම අධීක්ෂණය කළ බව ඇසින් දුටු සාක්ෂිකරුවන් පවසන මේජර් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා සහ ජනරාල් ජගත් ජයසූරිය ගෙන් ප්‍රශ්න කිරීම මගින් මේ කටයුත්ත ආරම්භ කළ හැකිය."*

යුද්ධයේ අවසන් දිනයේදී භාරවූවන්ගේ නාම ලේඛනයක් ශ්‍රී ලංකාවේදී හබයාස් කෝපස් නඩු පැවරූ ඥාතීන් හට භාර දීම ශ්‍රී ලංකා යුද හමුදාවේ 58 වැනි සේනාංකය විසින් දිගින් දිගටම ප්‍රතික්ෂේප කර ඇත[1]. භාරවූවන් භාරගත් හමුදා ඒකකය ලෙස එක්සත් ජාතීන්ගේ විමර්ශනය විසින් නම් කොට ඇති 58 වැනි

[1] See CHRD's excellent report Enforced Disappearance in Sri Lanka, Lessons from CHRD's Advocacy, 2015,http://srilankachrd.org/assets/book-a.pdf, which at P. 31 cites the army alleging "A substantial number of LTTE cadres and civilians fled to India by sea and later illegally migrated to West a[re] presently domiciled in Western countries. However their relatives pretend that they were abducted and killed by the Army.'
Also OISL (437) says the disappeared were last seen in the custody of the 58 Division.

සේනාංකයට එකල අණ දුන්නේ යුද අපරාධ චූදිත මේජර් ජනරාල් ශවේන්ද්‍ර සිල්වායි. ඔහු වර්තමාන රජය විසින් යුද හමුදවේ විධායක ජනරාල් ධුරයට උසස් කොට ඇත. නඩු නොඅසා ඝාතනය කර තිබුනු එල්ටීටීඊ නායකයන් හට වට්ටුවාක්කල් පාලම මත මැයි 18 ද සිටි ශවේන්ද්‍ර සිල්වා අතට අත දෙනු පවා ඇසින් දුටු බව සාක්ෂිකරුවන් විසින් දැනුම් දී තිබේ. ඔහු වාර්තා කළ ඉහළ නිලධාරියා වන ජෙනරාල් ජයසූරිය ද, පසුව ආරක්ෂක හමුද අත්අඩංගුවේ දී අතුරුදහන් වූ, එල්ටීටීඊ සාමාජිකයන් කණ්ඩායමක් කතෝලික පූජකවරයකු සමග භාරවන අවස්ථාවේ වට්ටිටුවාක්කල් පාලම මත සිටි බව ඇසින් දුටුවෝ පවසති. යුද අපරාධ චෝදනා රැගත් නඩු 4 ක් ITJP විසින් පවරන ලද ලතින් ඇමරිකාවේ, යුක්තිය මගහැර පලායන තුරු ජෙනරාල් ජයසූරිය තානාපති ධුරය දැරුවේය.

ශ්‍රී ලංකා යුද හමුදව හෙළි නොකර සිටින නම් ලැයිස්තුව ITJP සංවිධානයේ අතුරුදහන් වෙබ් අඩවිය විසින් නැවත සකස් කරනු ලැබේ. එහි දැනට නම් **280** ක් ඇති අතර දෙමළෙන් සහ ඉංග්‍රීසියෙන් පහත සබැඳියෙන් බලාගත හැකිය.

http://itjp.bong.international/#lang=english

*"තොරතුරු හෝ ඡායාරූප ඇති කිසිවකු හෝ වේ නම්, ඉංග්‍රීසියෙන් හෝ දෙමළෙන් අප සමග ඊ මේල් මගින් සම්බන්ධ වන ලෙස උදක්ම ඉල්ලා සිටිමු,"* යි ITJP විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය. *"මෙය කිසිසේත්ම අංග සම්පූර්ණ හෝ දෝෂ රහිත ලැයිස්තුවක් නොවේ. එහෙත් එය ආරම්භයකි. එයින් හෙළිදරව් වන්නේ අපරාධයේ පරිමාණය කලින් දැන සිටි තරමට වඩා අතිශයින් විශාල බවයි."*

ආගිය අතක් නැති සිය ආදරණීයයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමේදී ඥාතීන් විසින් උපන් නම යොද ගනු ලබන අතර හිටපු සටන් සගයන් විසින් සංවිධාන නාමය යොද ගැනීම නිසා එකම පුද්ගලයා නම් දෙකකින් දක්වා තිබීමට ඉඩ තිබෙන බව ITJP පිළිගනී. ඒ නිසා ඡායාරූප එක් කිරීම වැදගත් වන බව පවසන සංවිධානය, කිසියම් නිවැරදි කිරීමක් වේ නම් තමන් හා සම්බන්ධ වන ලෙස මහ ජනතාවගෙන් ඉල්ලා සිටියි. වෙබ් අඩවියේ අඳුරු හිස් කොටු තබා ඇත්තේ මෙය අවසන් ලැයිස්තුවක් නොව, කෙරෙමින් පවතින කටයුත්තක් බව දැක්වීම සඳහාය.

සෑම නමක්ම බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් විසින් ශේෂ කොට යන මනුස්ස වේදනාව දෙස අංශුමාත්‍ර ද වශයෙන් එබී බැලීමකි. වී බාලකුමාරන් පිළිබඳ පිටුවේ ඇතුලත් කිරීම සඳහා ඔහුගේ දියණිය විසින් මේ සටහන එවා තිබුනි.

*"අප්පා, මට හැමදම ඕනෑ වුනේ ඔබ සමග ඉන්නටයි. 2009 අප්‍රේල් සිට අපි ජීවත් වන්නේ ඔබ නැතිකමින් තුවාල වූ හදකින් යුතුවයි. ඔබ ඉතාම වැදගත් දෙමළ නායකයකු බව කිසිවකුටත් ප්‍රතික්ෂේප කළ නොහැකි කාරණයක්. ඒ වාගේම, නායකයකු හෝ පුද්ගලයකු හෝ කොයිතරම් ප්‍රසිද්ධ කෙනෙක් වුනත්, එය නොතකා සාමාන්‍ය ජීවිතයක් ගතකරන ආකාරය ඔබ ජීවිතයෙන්ම අපට පෙන්නා දුන්නා. ඔබට හැමවිටම අවශ්‍ය වුනේ මම ස්වාධීන, ධෛර්ය සම්පන්න සහ ශක්තිමත් ගැහැණු ළමයෙක් වීමටයි. කවර වාතාවරණයක දී වුවද පසු නොබසින සියලු ශක්තිය අපට ලබා දෙන එකම සාධකය ඔබයි. අපි ඔබ අතහරින්නේ නෑ, අප්පා. ඔබ නැති පාඩුව වචනයෙන් කියා නිම කරන්න බෑ. දවසක ඔබ අප ඉදිරියට ඇවිත් අපේ දෑස් සතුටු කඳුලින් පුරවාවි කියා අපි තදින්ම විශ්වාස කරනවා. ඒ එක්කම, තමන්ගේ තාත්තා, පුතා, දුව හෝ සහෝදර සහෝදරියන් අතුරුදහන් වූ සෑම පවුලකටම ඉක්මනින්ම නැවත එකතු වීමේ අවස්ථාව උදා වේවා කියා අපි බලාපොරොත්තු සහගතව යාඥා කරනවා.<br>ඔබේ සදදරණීය දුව".*

ITJP ලැයිස්තුවේ නම් සඳහන් අය අතුරුදහන් වීමට පෙර ශ්‍රී ලංකා යුද හමුද භාරයට ගන්නා ලද්දේ 2009 මැයි 18 හෝ ඊට ආසන්න දිනකදී බවට විශ්වාස කෙරේ. ඇතැමකු අතුරුදහන් වූ බව ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ ඥාතීන් විසින් වාර්තා කර තිබේ. විදේශීය රටවල් කිහිපයක සිටින සාක්ෂි කරුවන්ද, තමන් දුටු

ආරක්ෂක හමුද වෙත භාරවූ අය පිළිබඳව ITJP වෙත දිවුරුම් ප්‍රකාශ ලබා දී තිබේ[2].

ITJP වෙබ් අඩවිය මූලික වශයෙන් සකස් වී ඇත්තේ විවිධ ලැයිස්තු පහක් පදනම් කරගෙනය. දෙකක් ශ්‍රී ලංකාව තුළිනි. දෙකක් විදේශ වලිනි. අනෙක ප්‍රසිද්ධියට පත් කර ඇති අතුරුදහන් වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුවට ලැබුණු පැමිණිලි ලැයිස්තුවයි[3]. සැලකිල්ලට ගත යුතු කරුණ වන්නේ ලැයිස්තු අතර අතිපිහිත වීමක් ඇතත් එය සුවිශාල නොවන බවයි. එයින් සමහරවිට පෙන්නුම් කෙරෙන්නේ ඇතැම් එල්ටීටීඊ කාඩර් වරුන්ගේ ඥාතීන් අතුරුදහන් වීම් ගැන වාර්තා කිරීමට තවමත් බියෙන් සිටින බවය. නැතහොත්, පැමිණිලි කිරීම සඳහා පවුලේ සාමාජිකයන් තව දුරටත් ජීවතුන් අතර නැති බවය.

විශේෂයෙන්ම, කනස්සල්ලට හේතුවන කරුණක් වන්නේ මැයි 18 හෝ ඊට ආසන්න දිනකදී තම දෙමාපියන් සමග භාරවී අතුරුදහන් වූ දරුවන් 29 දෙනකු ගැන එහි සඳහන් වීමයි. ඉන් කිහිප දෙනකුම වයස අවුරුදු 5 ට අඩු අයයි.

*“මේ දරුවන්ගේ ඉරණම කුමක්දැයි දැනගැනීමට ශ්‍රී ලංකාවේ සිවිල් සමාජය එක හඬින් නැගී සිටිය යුතුය. අවුරුදු නමයක් ගතවී තිබේ. ඔවුන්ගේ ආච්චිලාට සහ අම්මලාට ආරක්ෂක හමුද වල අඩන්තේට්ටම් වලට සහ තර්ජන වලට මුහුණ දෙමින්[4] සත්‍යය හෙළි කරන ලෙස ඉල්ලීම සඳහා පාරවල් අද්දර තනිව සිටගෙන ඉන්නට ඉඩ හැරිය යුතු නැත,” යි යැස්මින් සූකා පැවසුවාය.*

යුද්ධයේ ඒ අවසන් දවස්වලදී ශ්‍රී ලංකා යුද හමුදව කළේ පොදු සමාවක් දෙන බවට පොරොන්දු වෙමින් දෙමළ ජනතාවට භාරවන ලෙස ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ප්‍රචාරය කිරීමය[5]. එක්සත් ජාතීන්ගේ වාර්තාව[6] සඳහන් කරන පරිදි, අතුරුදහන් වූ සමහරකු එල්ටීටීඊ සටන් කරුවන් ද නැද්ද යන්න අදළ නැත. මන්ද ඔවුන් ඒ වනවිට සන්නද්ධ හමුද භාරයට පත්වී සිටීම නිසා යුද සිරකරුවන් ගනයේ ලා සැලකෙන බැවිනි. ශ්‍රී ලංකාව සම්බන්ධ එක්සත් ජාතීන්ගේ වාර්තාවේ අදළ කොටස පහත නැවත පල කෙරේ.

## පසුබිම

**ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ (OISL) වාර්තාවෙන්** *(A/HRC/30/CRP.2)*

***“සන්නද්ධ ගැටුම අවසානයේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්***

***429.*** *ආණ්ඩුව දිගින් දිගටම ප්‍රතික්ෂේප කළත්[7], ප්‍රධාන වශයෙන්ම ආයුධ බිම තැබූ එල්ටීටීඊ සටන්කරුවන්ද, එල්ටීටීඊ සංවිධානයේ සන්නද්ධ නොවන කේඩරයන්ද, ඔවුන්ගේ සහායකයන් සහ පවුලේ සාමාජිකයන්ද ඇතුළු සැලකිය යුතු සංඛ්‍යාවක් 2009 මැයි 18 දින වට්ටුවාක්කල් පාලමින් එගොඩවී ශ්‍රී ලංකා යුද හමුදවට[8] “භාරවීමෙන්”[9] පසු අතුරුදහන් වූ බවට නැගෙන චෝදනා වලට ආධාරක වන විශ්වසනීය තොරතුරු හෙළිදරව් වී තිබේ.*

---

[2] See also http://www.white-flags.org produced by the ITJP in May 2014.

[3] A/HRC/WGEID/111/1

[4] CHRD reports that almost all the 14 families bringing habeus corpus cases have been threatened to drop their cases. P. 32. Enforced Disappearance in Sri Lanka

[5] Corroborated by CHRD in Colombo whose report says:
” On May 18, 2009, Sri Lankan security forces made public announcements calling all LTTE cadres to surrender, with a promise to grant general amnesty to those who did. The announcements stated that those who served for even one day should surrender into Army custody. Thereafter, each of the missing persons in the cases listed above surrendered into custody of the 58th Division of the Sri Lankan Army.”

[6] OISL, 2015, para 286, A/HRC/30/CRP.2.

[7] In January 2013, the then Defence Secretary, Gotabaya Rajapaksa, stated that none of the LTTE cadres who had surrendered to the security forces at the end of the war went missing. All of them, he said, underwent a proper rehabilitation programme and were reintegrated into society; Sri Lanka Brief, No LTTE surrendee went missing – Gotabaya Rajapaksa, 25 January 2013, http://srilankabrief.blogspot.ch/2013/01/no-ltte-surrendee-went-missing-gotabaya.html

[8] These cases may also be linked to the alleged extrajudicial executions described in the previous chapter.

[9] The term « surrender » is only applicable to members of an armed group that hand themselves over. It has been used here even though it is unclear who the LTTE cadres were, whether military or political.

**430.** මේ ඇතැම් සිද්ධි බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් හෝ අතුරුදහන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුවට (WGEID) වාර්තා කර ඇති අතර ඔවුන්ගේ 2012 සහ 2014 වාර්තාවල[10] ඒ බව සඳහන් කර තිබේ. මේ වනතුරු දැකගන්නට ලැබී නැති එල්ටීටීඊ සාමාජිකයන් හෝ සාමාන්‍ය වැසියන් භාර වනු දුටු බව පවසන පුද්ගලයන්ගේ ප්‍රකාශ සහ වෙනත් සාක්ෂිද OISL කමිටුවට ලැබී තිබේ[11]. යුද්ධයේ අවසානයේ භාරවී අතුරුදහන් වූ බව පවසන එල්ටීටීඊ සාමාජිකයන් 53 දෙනකු ගැනද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන (LLRC) කොමිසමත් සිය වාර්තාවේ සඳහන් කර තිබේ[12]. 2009 මැයි 18 හෝ ඒ ආසන්න දිනකදී යුද හමුද "අත්අඩංගුවට භාරවූ" බව දකිනු ලැබූ පුද්ගලයන් 110 ක නම් ලැයිස්තුවක් ශ්‍රී ලංකාවේ සත්‍යය හා යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතිය (ITJP) විසින් 2015 මැයි මාසයේදී පල කර තිබේ[13].

**431.** මූලික සෝදිසියෙන් පසු මුලතිව් හි වැටකින් වටකොට තිබුනු රැඳවුම් ස්ථානයක සිටියදී සොල්දදුවන් හෝ දෙමළ ඔත්තුකරුවන් පැමිණ තමන්ගේ සමහර පවුලේ සාමාජිකයන් රැගෙන ගිය බව සාක්ෂිකරුවන් OISL සමග පවසා තිබේ. එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇති බව පිළිගත් පුද්ගලයන් ඥතීන්ගෙන් වෙන් කර වෙනම පෝලිම් වලට යවන ලද බවද OISL සමග ප්‍රකාශ කරන ලදී.

**432.** තමන් හෝ තමන්ගෙන් වෙන් කරන ලද අය හෝ කොහි ගෙනයන්නේද යන්න පිළිබඳව ආරක්ෂක හමුදව කිසිම තොරතුරක් නොදුන් බව සාක්ෂිකරුවෝ OISL සමග කියා සිටියහ. වයස අවුරුදු දෙකත් දහයත් අතර ළමයින් පස් දෙනකුද ඇතුළු තමන්ගේ ආදරණීයයන් රැගෙන යන ආකාරය ඒ සාක්ෂිකරුවන් (භාර්යාවන්, මව්වරුන්, මුත්තනුවන් හා මිත්තනියන්) දැක තිබේ.

**433.** වඩාත් පුළුල් ලෙස ලේඛනගත කර ඇති සිද්ධිය වන්නේ ෆ්‍රැන්සිස් ජෝසප් කතෝලික පියතුමා සමග ගිය කණ්ඩායමක් මැයි 18 වැනිද භාරවීමයි. වට්ටුවාක්කල් වලදී යුද හමුදවට තමුන් හඳුන්වා දුන්[14] ෆ්‍රැන්සිස් පියතුමා යුද්ධයෙන් තුවාල වූ එල්ටීටීඊ සටන්කරුවන් සහ හමුද කටයුතු නොකරන එල්ටීටීඊ සාමාජිකයන්[15] කණ්ඩායමක් සමග[16] එද උදෑසන රැඳවුම් ස්ථානයේ සිටිනු සාක්ෂිකරුවන් ගණනාවක් විසින් දැක තිබේ.

**434.** එල්ටීටීඊ සාමාජිකයන් "භාරවීම" ඔහු විසින් සෘජුවම ආරක්ෂක හමුද සාමාජිකයන් සමග සම්බන්ධීකරණය කරනු දැක තිබුනි. එහි සිටි එක් අයෙක් "ඔහු වටා විශාල ආරක්ෂාවක් යොදවා සිටි සහ පදක්කම් විශාල සංඛ්‍යාවක් පැළඳ සිටි" ඉහල නිලයක් දරන නිලධාරියකු බව විශ්වාස කෙරේ.

**435.** මඳ වේලාවකට පසු, ෆ්‍රැන්සිස් පියතුමා සහ පිරිස මුලතිව්හි ප්‍රථමාධාර මධ්‍යස්ථානය අසල සෝදිසි මුරපොලට වම් පැත්තේ පාර දිගේ කැඳවාගෙන ගොස්, දකුණු දිසාවට යන පාරට රැගෙන යනු සාක්ෂි කරුවන් විසින් දැක තිබේ[17]. ෆ්‍රැන්සිස් පියතුමා සහ එල්ටීටීඊ සාමාජිකයන් අවසන් රැඳවුම් ස්ථානයෙන් නැගෙනහිර දිසාවට වෙන්නට තිබුනු බස් රථවලට නංවා ගනු[18] ඇතැම් සාක්ෂිකරුවන් දැක තිබේ. එද පටන් ෆ්‍රැන්සිස් පියතුමා ඇතුළු කණ්ඩායමේ කිසිවකු ගැන අසන්නට දකින්නට නැත.

**436.** ළමුන් පස් දෙනකු ඇතුළු පුද්ගලයන් 22 ක් ගැන ඉන් පසු හබයාස් කෝපුස් පෙත්සම් 14 ක් ගොනු කර තිබේ. එයින් 13ක් වවුනියාව මහාධිකරණයේය. (2013 මාර්තු 20 වැනිද පහක්, 2013 අගෝස්තු 7 හතක්, 2014 මැයි 23 එකක්). අනික මන්නාරම මහාධිකරණයේය. ඒ 22 නම්: ෆ්‍රැන්සිස් ජෝසප් පියතුමා; මුරලිදරන් නඩේසු, ඔහුගේ භාර්යාව මුරලිදරන් ක්‍රිෂ්ණකුමාරි සහ පොඩි දරුවන් දෙදෙනා; මහාලිංගම් සින්නතම්බි (හෙවත් ඉලම්පරිදි), ඔහුගේ භාර්යාව මහාලිංගම් සිවන්ජනී සහ ඒ වනවිට අවුරුදු 10, 8 සහ 3 වයස්වල සිටි ඔවුන්ගේ දරුවන් තුන්දෙනා; සින්නදුරෙයි සසිදරන් (එලිලන්); සෙල්ලයියා විශ්වනාදන්; පොන්නම්බලම් කන්දසාමි; රුද්‍රමූර්ති ක්‍රිෂ්ණකුමාර්; කන්දසාමි දුෂ්‍යන්කර්; ත්‍යාගරාජා දිනේෂ්; නඩේසමූර්ති විෂ්ණුකුමාර්; මහේන්ද්‍රන් මුරුගදස්;

---

[10] WGEID Annual report 2012, A/HRC/19/58/Rev.1 pages1pages 111-113.

[11] WS on file. OISL also received a large number of submissions.

[12] LLRC Report, para. 1.49: According to the Commissioner General of Rehabilitation, the Commission understands that there were 11,954 former LTTE combatants undergoing rehabilitation after they surrendered or who were otherwise taken into custody.

[13] International Truth & Justice Project Sri Lanka, Sri Lanka : Disappearances in Custody Six Years Ago Today, 18 May 2015, http://tamilsforum.co.uk/wp-content/uploads/2015/05/Statement-18-May-2015-ITJP-SL-Disappearances.pdf

[14] WS on file

[15] WS on file

[16] WS on file

[17] WS on file

[18] WS on file

*තනබාලසිංහම් විජයබාස්කර්; සිවඥානම් ගෝපාලරත්නම් සහ ඔහුගේ භාර්යාව සිවලිංගම් පත්මලෝසිනී; කාලිමුත්තු සජීවන්; සහ වී බාලකුමාර්.*

***437.*** *අවස්ථා දෙකකදී හැරුනුකොට මේ පුද්ගලයන් මැයි 18 මුලතිව් රැඳවුම් කලාපයේ සිටියවුන් අතර අවසාන වතාවට දකින්නට ලැබුනු අයයි. එක් පුද්ගලයකු දකින්නට ලැබුනේ මැයි 18 වැනිද ඕමන්තෙන් ගෙනියන අවස්ථාවේදීය. අනික් තැනැත්තා මුලතිව් රැඳවුම් ස්ථානයෙන් දින දෙකකට පෙර ට්‍රැක්ටරයකින් ගෙනයනු ලැබුවේ ඔහු තුවාල ලබා සිටි නිසාය. අතුරුදහන් වූවන් අවසාන වතාවට දකිනු ලැබුවේ ශ්‍රී ලංකා යුද හමුදවේ 58 වැනි සේනාංකයේ අත් අඩංගුවේ සිටියදී බව සියලුම පෙත්සම් වල සඳහන් වෙයි.*

***438.*** *පෙත්සම් වලට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා යුද හමුදව පවසා ඇත්තේ ඒ පුද්ගලයන් අත් අඩංගුවට ගත්තේ හෝ රඳවා තබා ගත්තේ හෝ නැති බවයි. ඇතැම් සිද්ධි සම්බන්ධයෙන් පවසා ඇත්තේ "යුද හමුදව විසින් මුද ගන්නා ලද ප්‍රදේශ වලට පැමිණි සිවිල් වැසියන් සම්බන්ධයෙන් නීති ගරුකව කටයුතු කොට ඔවුන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය සහතික කළ," බවයි. තවත් සිද්ධි සම්බන්ධයෙන් එය පවසා සිටියේ "සෑම අවස්ථාවකදීම, ශ්‍රී ලංකා යුද හමුදව යුද කටයුතු සම්බන්ධයෙන් යොදගත හැකි ජාත්‍යන්තර ප්‍රතිමාන අනුගමනය කර තිබේ," යනුවෙනි. ආගිය අතක් නැති බොහෝ දෙනා යුද හමුදව සමග සටනේදී මියගිය හෝ නීති විරෝධී ලෙස රට හැර පලා ගොස් බටහිර රටවල ජීවත් වන හෝ බවද ඔවුහු ප්‍රකාශ කරති.*

***439.*** *"විශේෂයෙන්ම, යුද්ධයේ අවසාන දවස්වලදී ශ්‍රී ලංකා යුද හමුදවට භාරවූ හෝ අත් අඩංගුවට ගනු ලැබූ එල්ටීටීඊ කේඩරයන් ගේ අතුරුදහන් වීම් පිලිබඳ කියැවෙන ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව" පිළිබඳව* LLRC *තම වාර්තාවේ "බරපතල අවධානයක්" යොමුකර තිබේ. "පවුලේ සාමාජිකයන් විසින් කියන ලද පරිදි, ඔවුන් තමන්ගේ ස්වාමි පුරුෂයන් සමග හමුද මුරපොලට වාර්තා කළ විට, ඔවුන්ගේ ස්වාමි පුරුෂයන් විමර්ශන සඳහා අවශ්‍ය නිසා රඳවා ගන්නා බව කියා, ඥතීන්ට අනාථ කඳවුරට යන ලෙස පවසා තිබේ. සමහර අවස්ථා වලදී තම ස්වාමිපුරුෂයන් යුද හමුදවට භාර වෙනු භාර්යාවන් විසින් දැක තිබේ. පවුල් පිටින් භාරවූ අවස්ථා පිළිබඳවද කොමිසමට දැනගන්නට ලැබුනි. මේ සියලු ඉදිරිපත් කිරීම් වලින් මතුවන ස්ථිරසාර තේමාව වන්නේ, ශ්‍රී ලංකා යුද හමුදවට භාර වන අවස්ථාවේ අවසාන වතාවට දැක ගන්නට ලැබුනු තම ස්වාමි පුරුෂයන් ගැන ඉන් පසුව අසන්නට, දකින්නට ලැබී නැත යන්නයි."*

***440.*** LLRC *විසින් මෙසේ අවධාරණය කරන ලදී: "රාජ්‍යයේ පැහැදිලි වගකීම වන්නේ එවැනි නිශ්චිත චෝදනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා, එවැනි පරීක්ෂණ වලින් හෙළිවන පරිදි යුද හමුදවේ පුද්ගලයන් විසින් කිසියම් නීති විරෝධී කටයුත්තක් කර තිබේ නම්, නඩු පවරා වරදකරුවන්ට දඬුවම් කිරීමයි." එමනිසා, එය සඳහන් කළ පරිදි, "මේ සිදුවීම් සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් කිරීම අත්‍යාවශ්‍යය.*[19]*"*

***441.*** *රැගෙන යන ලද පුද්ගලයන්ගේ ඉරණම සහ ඉන්නා තැනක් සොයාගැනීම සඳහා මේ සිද්ධි සම්බන්ධයෙන් ආණ්ඩුව කිසිම විශ්වසනීය, අංග සම්පූර්ණ සහ ස්වාධීන පරීක්ෂණයක් කළ බවක් දැනගන්නට නැත. ඇතැම් සිද්ධි සම්බන්ධයෙන් ආණ්ඩුව ප්‍රකාශ කළේ වින්දිතයන් යුද්ධයෙන් මළ බවයි. ඒ ඔවුන් අත් අඩංගුවට ගන්නා ලද බව සාක්ෂිකරුවන් දැක තිබියදීය.*

***442.*** *යුද ගැටුම අවසානයේ කී දෙනෙක් අතුරුදහන් වූයේදැයි පැහැදිලි නැත. පාරදෘශ්‍ය භාවයක් නැති වීමත් ගැටුම් පැවතුනු ප්‍රදේශ වලින් පිටතට පැමිණෙන්නන්, වර්ගීකරණයක් අනුව වෙන් කිරීම (විශේෂයෙන් එල්ටීටීඊ කේඩරයන් සහ සාමාන්‍ය වැසියන්) අතුරුදහන් වීම් සඳහා මග පෑදූ තවත් අමතර සාධකයකි. මූලික සෝදිසි කිරීම සහ ඉන් පසු සිදුවූ රඳවා තබා ගැනීම් අඛණ්ඩව ස්වාධීන වශයෙන් අධීක්ෂණය කෙරුනේ නැත. එහි ප්‍රතිපලය වූයේ, සංඛ්‍යාව පැහැදිලි නැති වීමත්, යුද්ධයේ අවසාන භාගයේ අත් අඩංගුවට ගන්නා ලද අය පිළිබඳව සංඛ්‍යාලේඛන නැතිද යන්න ගැන නිශ්චිත නිගමනයකට ඒමට නොහැකිවීමත් ය.*

***443.*** OISL *වෙත ලැබී ඇති තොරතුරු සැලකිල්ලට ගත් කල, යුද්ධය අවසානයේ භාරවූ එල්ටීටීඊ කේඩර්වරුන් සැලකිය යුතු සංඛ්‍යාවකගේ ඉරණම ගැන දැනගන්නට නැත. සාක්ෂිකරුවන් ගණනාවක් විසින් දුන් සාක්ෂිවාචක අනුව ඔවුන්ගේ ආදරණීයයන් අතුරුදහන් වී ඇත. එමනිසා, "භාරවූවන්" ලෙස ලියාපදිංචි වූ එක්, එක් පුද්ගලයන්ගේ ඉරණම පැහැදිලි කිරීම සඳහා, එම ලැයිස්තු පිළිබඳ ස්වාධීන විමර්ශනයක් අනිවාර්ය බව* OISL *විශ්වාස කරයි.*

[19] LLRC report, paras 4.318-4.319.

**2009 මැයි 18 අත් අඩංගුවට භාරවීම් වලට අදළ** ITJP **කාල නිර්ණය**

2011: සිද්ධි 20ක් ගැන හියුමන් රයිට්ස් වොච් (**HRW**) වාර්තා කරයි[20].
2011: යුද්ධයේ අවසන් දවස්වලදී භාරවී අතුරුදහන් වූ බව පැවසෙන එල්ටීටීඊ කේඩරයේ 53 ක් ගැන **LLRC** *ජනාධිපති කොමිසම ලියාපදිංචි කරගනී.*
**2014:** 2009 මැයි 18 හෝ ඒ අවට දිනකදී ශ්‍රී ලංකා යුද හමුදවට "භාරවූ" බව සාක්ෂිකරුවන් විසින් ඇසින් දුටු පුද්ගලයන් 110 ක ලැයිස්තුවක් **ITJP** විසින් පල කෙරේ.
**2018:** නම් **280** ක් ඇතුලත් වෙබ් අඩවියක් **ITJP** විසින් පල කෙරේ.

-----

**ශ්‍රී ලංකාවේ ආගිය අතක් නැති/ අතුරුදහන් පිරිස පිළිබඳ විවිධ සංඛ්‍යා ලේඛන**

**1994:** බලහත්කාරයෙන් අතුරුදහන් කරනු ලැබුවන්ගේ සංඛ්‍යාව 16,800 ක් බව ශ්‍රී ලංකාවේ කොමිසම් තුනක් සනාථ කරයි.
**2015:** නොවිසඳුනු සිද්ධි 5,750ක් ඇති බව (කලින් 12,341) බලහත්කාරයෙන් හා නොකැමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුව (WGEID) පවසයි[21].
**2017:** යුද්ධය අවසාන වූ පසු 20,000 ක් ආගිය අතක් නැති බව ආණ්ඩුවේ ඇස්තමේන්තු වල දැක්වෙයි.[22]
**2018:** සංහිඳියා යාන්ත්‍රණ පිළිබද සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය පවසන පරිදි 16, 000 ක් අතුරුදහන්ය. මෙයින් 5,100 ක් ආරක්ෂක හමුද වලට අයත්ය[23].
මේ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට ලැබුනු පැමිණිලි සංඛ්‍යාව බව පෙනී යයි[24].
**2016:** පරණගම කොමිසමට පැමිණිලි 24,000 කට වඩා ලැබුනු බව ප්‍රකාශ වී තිබේ[25].
**2016:** 1994 සිට අතුරුදහන් වුවන්ගේ සංඛ්‍යාව 65,000 ක් බව ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශයේ (ONUR) සභාපතිනිය ප්‍රකාශ කරයි[26].
**2018:** අතුරුදහන් සංඛ්‍යාව 100,000 ක් බව ඇම්නස්ටි ජාත්‍යන්තරය ප්‍රකාශ කරයි[27].

(සමාප්තයි)

[20] Sri Lanka: Account for Wartime Disappearances: More Than 20 People Last Seen in Army Custody Remain Missing, 7 April 2011, https://www.hrw.org/news/2011/04/07/sri-lanka-account-wartime-disappearances
[21] A/HRC/30/38, 10 August 2015l
[22] New Indian Express, 20 July 2017, http://www.newindianexpress.com/world/2017/jul/20/sri-lankan-president-signs-office-on-missing-persons-act-1631327.html
[23] tweet @officialscrmsl Apr 18
[24] "The International Committee of the Red Cross (ICRC) claims to have received over 16,000 tracing requests since 1990, including approximately 5,200 from the families of missing military and police personnel", IMADR submitted a written statement on "Enforced and Involuntary Disappearances in Sri Lanka" at the 33rd session of the Human Rights Council, http://imadr.org/enforced-and-involuntary-disappearances-in-srilanka-hrc33-2016-ws/
Also Sri Lanka: Report released on needs of families of missing persons, 26 July 2016, ICRC https://www.icrc.org/en/document/sri-lanka-families-missing-persons
[25] IMADR as above. Also media: http://www.dailynews.lk/2016/08/26/local/91521
[26] Reuters: Sri Lanka admits 65,000 missing from war, insurrection, 8 June 2016, https://in.reuters.com/article/sri-lanka-rights-idINKCN0YU277
[27] Mothers of Sri Lanka's 100,000 'disappeared' desperately looking for answers, 27 March 2018, ITV, http://www.itv.com/news/2018-03-27/sri-lanka-civil-war-missing-tamil-president-sirisena-colombo-disappearing-amnesty-international-united-nations/ and Amnesty "Since the 1980s, Amnesty International estimates there have been at least 60,000 and as many as 100,000 cases of enforced disappearance in Sri Lanka." https://www.amnesty.org/en/latest/news/2017/04/sri-lanka-victims-of-disappearance-cannot-wait-any-longer-for-justice/

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT